මගේ අංකය / எனது இல. / My No.    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2022-01-03

පැමිණිලි පාර්ශවය : එච්.ජී.සී ජයලත් මයා,
නො : 156/35, ක්‍රිස්ටල් ටෙරස්,
මාළඹේ පාර,
පන්නිපිටිය.

වගඋත්තරකාර පාර්ශවය : 01. වෛද්‍ය සුසිත සේනාරත්න මයා,
අධ්‍යක්ෂ,
ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල,
තලපත්පිටිය, නුගේගොඩ.

02. වෛද්‍ය අතුල කහඳලියනගේ මයා,
සභාපති,
ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල,
තලපත්පිටිය, නුගේගොඩ.

**<u>පැමිණිලි අංකය : HRC/1070/17</u>**

**පැමිණිල්ලේ සාරාංශය :-**

ඉහත පැමිණිලිකරු විසින් 2017.03.20 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, තමා සමස්ත ලංකා සුවසේවා සංගමයේ ශ්‍රී ජයවර්ධනපුර රෝහල් ශාඛාවේ ලේකම් ලෙස කටයුතු කරන බවත්, සේවක ගැටළු සම්බන්ධයෙන් තමා නියෝජනය කරන වෘත්තීය සමිතිය ඇතුළු තවත් වෘත්තීය සමිති කිහිපයක් 2017.02.09 වන දිනට ප්‍රථම පාලනාධිකාරිය සමඟ සාකච්ඡාවක් ඉල්ලා සිටි බවත්, ඒ අනුව 2017.02.09 දිනැති ලිපියක් මගින් 2017.02.14 දින සවස



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

2.00 ට සාකච්ඡාවක් පවත්වන බවට ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ අධ්‍යක්ෂවරයාගේ අත්සනින් යුතුව සම්බන්ධීකාරක වෘත්තීය සමිති එකමුතුව වෙත ලිපියක් යොමුකර තිබූ බවත් සඳහන් කර ඇත.

පසුව 2017.02.14 දින ප.ව 2.00 ට සමස්ත ලංකා සුවසේවා සංගමයේ ශ්‍රී ජයවර්ධනපුර රෝහල් ශාඛාවේ ශාඛා ලේකම්වරයා ලෙස තමාද එම සාකච්ඡාවට සහභාගී වූ බවත්, තමා සහ එම සංගමයේ සභාපතිවරයාද සහභාගි වුවත්, රෝහල් අධ්‍යක්ෂවරයාත් රෝහල් සභාපතිවරයාත් එකතුව තමා සාකච්ඡාවට සහභාගී වීම පිළිබඳ විරෝධය පළ කරමින් ඔවුන්ගේ නිලය හා බලය භාවිතා කොට තමාව සාකච්ඡාවෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලද බවත් ප්‍රකාශ කර ඇත.

තමාට එරෙහිව ආයතනය තුළ විනය පරීක්ෂණයක් පැවැත්වෙන බවත්, ඉදිරියේදී තවත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට ඇති හෙයින් තමා සාකච්ඡාවට සහභාගී වීම පිළිබඳව විරෝධය පළකරන ලද බවත්, මෙම සාකච්ඡාවේදී වෘත්තීය සමිති සාමාජිකයන් වෙනුවෙන් සමස්ත ලංකා සුවසේවා සංගමයේ ශ්‍රී ජයවර්ධනපුර රෝහල් ශාඛාවේ ශාඛා ලේකම්වරයා ලෙස පෙනී සිටීමට ඇති අවශ්‍යතාවය පැහැදිලි කළද, වගඋත්තරකරුවන් එය නොපිළිගත් බවත් සඳහන් කර ඇත. තමා එම ස්ථානයෙන් පිටතට නොයන්නේ නම් වගඋත්තරකරුවන් එම සාකච්ඡාවෙන් ඉවත් වන බව ප්‍රකාශ කිරීම මත අනෙක් වෘත්තීය සංගම්වල සාමාජිකයින්ට මෙම ගැටළුව විසඳා ගැනීමේ අවශ්‍යතාවය මත තමාට එම සාකච්ඡාවෙන් ඉවත්ව සිටින ලෙසට ඉල්ලීමක් කළ බවත්, ඒ අනුව වගඋත්තරකරුවන්ගේ බලපෑම් මත සාකච්ඡාවෙන් ඉවත් වීම හේතුකොටගෙන තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත.

**පැමිණිල්ල සනාථ කිරීමට ඉදිරිපත් වී ඇති සාක්ෂි :-**

රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමයේ ජයවර්ධනපුර මහ රෝහලේ ශාඛා සභාපති පී.වී.සී රුද්‍රිගු මහතාගේ අත්සනින් යුතු 2018.06.10 දිනැති ලිපියක් පැමිණිල්ලේ සාක්ෂි ලෙස කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එම ලිපියට අනුව උක්ත සාකච්ඡාවට වෘත්තීය සමිති කිහිපයක් සහ පරිපාලන නිලධාරීන් මෙන්ම සභාපතිතුමාද සහභාගී වී සිටි බවත් දන්වා ඇත.

එම අවස්ථාවට පැමිණි රෝහල් අධ්‍යක්ෂතුමා විසින් මෙම සාකච්ඡාවට චන්දන ජයලත් සිටීනම් සාකච්ඡා කළ නොහැකි බව පවසන ලද බවත්, චන්දන ජයලත් මහතා ඊට හේතු විමසූ බවත්, ඉන් පසු ඔහු සාකච්ඡාවට සහභාගී නොවී ඉවත් වන ලද බවත් ප්‍රකාශ කර ඇත. මෙම සාක්ෂිය අනුව පැමිණිලිකරු වන චන්දන ජයලත් යන අය සිටී නම් සාකච්ඡාව පැවැත්විය නොහැකි බව සඳහන් කිරීම තුළින්

පැමිණිලිකරුට සාකච්ඡා පැවැත්වෙන ස්ථානයෙන් ඉවත් වන ලෙසට යම් බලපෑමක් කළ බවට පිළිගත හැකි සාක්ෂියක් බව නිරීක්ෂණය වේ.

සමස්ථ ලංකා සුවසේවා සේවක සංගමයේ ජයවර්ධනපුර මහ රෝහලේ ශාඛාවේ සභාපති වන ඒ.වී.එල්.සී අංගම්පිටිය මහතා විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත එම සංගමයේ ලිපි ශීර්ෂ යටතේ 2018.06.12 දිනැතිව ලිපියක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, වගඋත්තරකරුවන් විසින් 2017.02.14 දින ප.ව 2.00 ට වෘත්තීය සමිති සාමාජිකයන් හා පවත්වන ලද සාකච්ඡාවේදී පැමිණිලිකාර චන්දන ජයලත් මයා ඉවත් කරන ලෙසට ප්‍රකාශයක් කළ බවත්, එසේ ඔහු ඉවත් නොවන්නේ නම් තමන් සාකච්ඡාවෙන් ඉවත් වන බවට රෝහල් අධ්‍යක්ෂවරයා ප්‍රකාශ කර ඇති බව මෙම ලිපියේ සඳහන් කර ඇත. ඒ අනුව චන්දන මහතා මෙම සාකච්ඡාවෙන් ඉවත් වී ඇත. එම හේතුව මත වෘත්තීය සමිති සාමාජිකයින්ට වෙනස්කමක් සිදුකර ඇති බවත්, එය සිදු නොවිය යුතු බවත්, ඔවුන් පෙන්වා දී ඇත. මෙම සාක්ෂියද පැමිණිල්ල සනාථ කිරීමට ඇති සාක්ෂියක් ලෙස පිළිගත හැකි බව නිරීක්ෂණය වේ.

2017.02.20 දිනැතිව සමස්ත ලංකා සුව සේවක සංගමයේ සභාපති සමන්ත කෝරලේආරච්චි මහතා විසින් ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ සභාපති වෙත ලිපියක් නිකුත් කරමින් සංගමයේ ශාඛා ලේකම්වරයා සාකච්ඡාවෙන් ඉවත් කිරීමට හේතු විමසා සිටියද, පිළිතුරු ලබා දී නොමැති බව පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කර ඇත. එම ලිපියේ පිටපතක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**වගඋත්තරකරුවන්ගේ වාචික කරුණු දැක්වීම :-**

**ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ මානව සම්පත් කළමණාකරු සරත් රොබට්සන් මහතාගේ කරුණු දැක්වීම -**

2017.02.14 දින ආයතනයේ සියළු වෘත්තීය සමිති සමඟ සාකච්ඡාවක් පැවැත්වූ බව සත්‍යයක් බවත්, එයට තමාද සහභාගී වූ බවත්, එම සාකච්ඡාවට ආයතනයේ සියළුම වෘත්තීය සමිති නිලධාරීන් සහභාගී වූ අතර, එහි වෘත්තීය සමිති සාමාජිකයන් 20 කට ආසන්න ප්‍රමාණයක් පැමිණ සිටි බවත් ප්‍රකාශ කර ඇත.

සාකච්ඡාව ආරම්භ කරමින් රෝහල් අධ්‍යක්ෂතුමා විසින්, සමස්ථ ලංකා සුවසේවා සංගමයේ ශාඛා ලේකම් අසත්‍ය ප්‍රකාශ සිදුකර ඇති බැවින් ඔහු සිටීනම් තමන්ට මෙම සාකච්ඡාවට සහභාගී විය නොහැකි බවට ප්‍රකාශ කරන ලද බවත් සඳහන් කර ඇත.

එහිදී රෝහල අධ්‍යක්ෂතුමා නොමැතිව මෙම සාකච්ඡාව පැවැත්වීමට නොහැකි බැවින් පැමිණ සිටි සාමාජිකයන් විසින් තීරණයක් ගතයුතු බවට රෝහල් සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලද බවත්, ඒ අවස්ථාවේ පැමිණිලිකාර වන්දන මහතා තම අදහස් ප්‍රකාශ කර හේතු විමසා පසුව එම ස්ථානයෙන් ඉවත් වූ බවත් සඳහන් කර ඇත.

ඉන්පසුව සාකච්ඡාව පැවැත්වූ අතර, වන්දන මහතා ඉවත් වීම සම්බන්ධයෙන් ඒ අවස්ථාවේදී වෘත්තීය සමිති සාමාජිකයෝ විරෝධය පළ නොකරන ලද බවත්, එසේම, රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමය මගින් ලබා දී ඇති ලිපියෙන් ද ඔවුන් පවසා ඇත්තේ, වන්දන මහතා ඉවත් වූ බවට වන අතර, මෙහිදී කිසිදු අවස්ථාවක අධ්‍යක්ෂවරයා හෝ සභාපතිවරයා වන්දන මහතාට ඉවත් වන ලෙස දන්වා නොසිටි බවත් සඳහන් කර ඇත. ඔවුන් දන්වා සිටියේ තමා මෙම සාකච්ඡාවට සහභාගී නොවන බවට වන බවද සඳහන් කර ඇත. මවු සංගමයේ සභාපතිවරයා යොමුකර ඇති ලිපිය සම්බන්ධයෙන් හා තමා දැනුවත් නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් තමාට කිසිවක් ප්‍රකාශ කළ නොහැකි බවද දක්වා ඇත.

**වගඋත්තරකරුවන්ගේ ලිඛිත කරුණු දැක්වීම :-**

**2018.04.17 දිනැති ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ මානව සම්පත් ප්‍රධානී ඊ.එම්.ජේ අබේරත්න මහතාගේ ලිඛිත කරුණු දැක්වීම :-**

පැමිණිලිකාර විදුලි කාර්මික ඒ.පී වන්දන ජයලත් යන අය ආයතනය තුළ විෂමාචාර හා රාජකාරී පැහැර හැරීම් සම්බන්ධයෙන් 2016.02.10 දින ඔහු වෙතින් නිදහසට කරුණු විමසා ඇති බවත්, ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කිරීමෙන් පසු මොහුට තරයේ අවවාද කර ඇති බවත් වාර්තා කර ඇත.

ආයතනය තුළ අනුමැතියකින් තොරව පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් තරයේ අවවාද කර ඇති බවත්, දැනට වෘත්තීය සමිති සාමාජිකයත්වය අනිසි ලෙස භාවිතා කර රාජකාරී කටයුතු වලට බාධා කිරීම හා ඒ තුළින් අනෙකුත් සේවකයන්ට, රෝගීන්ට සිදුවන අපහසුතා වැළැක්වීම සඳහා කළමණාකරණය විසින් නැවත දන්වන තුරු 2018.01.11 දින සිට මෙම පැමිණිලිකරු අනිවාර්ය නිවාඩු යවා ඇති බවත් සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරු වගඋත්තරකාර ආයතනයේ සේවය කරන අතර, සමස්ත ලංකා සුවසේවා සංගමයේ ශ්‍රී ජයවර්ධනපුර රෝහල් ශාඛාවේ ලේකම් වේ. වෘත්තීය සමිතියක ලේකම්වරයෙකු ලෙස පාලනාධිකාරිය සමඟ පවත්වන සාකච්ඡාවකට සහභාගී වීමට පැමිණිලිකරුට අවස්ථාව ලබා නොදීම තුළින් පැමිණිලිකරුව වෙනස්කමකට භාජනය කර ඇති බව පැමිණිලි පාර්ශවය විසින් සිය පැමිණිල්ලෙන් කරුණු ඉදිරිපත් කර ඇත.

පැමිණිල්ල සනාථ කිරීමට ලිඛිත හා වාචික සාක්ෂි ඉදිරිපත් වී ඇති අතර, පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති සාක්ෂි මඟින් පැමිණිලිකරු විසින් වගඋත්තරකරුවන්ට එරෙහිව ඉදිරිපත් කරන චෝදනාව සනාථ වන බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් විසින්ද ඉදිරිපත් කර ඇති කරුණු අනුව පැමිණිලිකරු මෙම සාකච්ඡාවට සහභාගී වන්නේ නම් අධ්‍යකෂවරයා මෙම සාකච්ඡාවට සහභාගී නොවන බවත්, එම හේතුන් මත ආයතනයේ සභාපතිවරයාද මෙම සාකච්ඡාවට සහභාගී නොවන බව ප්‍රකාශ කර ඇති බවද නිරීක්ෂණය වේ. එමෙන්ම පැමිණිලිකාර චන්දන මහතාට එම සාකච්ඡාවෙන් ඉවත් වන ලෙස රෝහල් අධ්‍යක්ෂවරයා හෝ සභාපතිවරයා ප්‍රකාශ නොකළ බව වගඋත්තරකරුවන්ගේ ස්ථාවරය වේ.

මෙහිදී දෙවන වගඋත්තරකරු පැමිණිලිකාර චන්දන මහතාට සාකච්ඡාවෙන් ඉවත් වන ලෙස ප්‍රකාශ කළ බව සඳහන් නොකළද චන්දන මහතා මෙම ස්ථානයෙන් ඉවත් නොවන්නේ නම් 2 වන වගඋත්තරකරු මෙම සාකච්ඡාවට සහභාගී නොවන බව ප්‍රකාශ කිරීමෙන් සහ රෝහල් සභාපතිවරයා විසින් රෝහල් අධ්‍යක්ෂ නොමැතිව මෙම සාකච්ඡාව පැවැත්විය නොහැකි බැවින් පැමිණ සිටි සාමාජිකයන් විසින් තීරණයක් ගත යුතු බව ප්‍රකාශ කිරීම තුළින් පැමිණිලිකාර චන්දන මහතා සාකච්ඡාවෙන් ඉවත් කිරීමට උත්සහයක් දරා ඇති බව නිරීක්ෂණය වේ. කෙසේ හෝ පැමිණිලිකරු රැස්වීම් ස්ථානයෙන් පිට නොවුනා නම් එදින රැස්වීම පැවැත්විය නොහැකි බව පැහැදිලි වේ.

පැමිණිලිකරුට විරුද්ධව මීට පෙරද පාලනාධිකාරිය විසින් යම් යම් විනය ක්‍රියාමාර්ග ගෙන ඇති බවට කරුණු වාර්තා වී ඇති නමුත්, පැමිණිලිකරුද 2017.02.14 දින වන විට (ප්‍රශ්නගත දිනය) සාමාන්‍ය පරිදි ආයතනයේ සේවය කරමින් සිටින බව නිරීක්ෂණය වී ඇත.

ශ්‍රී ලංකා මාන වහිමිකම් කොමිෂන් සභාව හමුවේ විමර්ශනය පවත්වන ලද 2018.06.18 දින වන විට පැමිණිලිකරුව අනිවාර්ය නිවාඩු යවා ඇති බවද විමර්ශනයේදී හෙළිවී ඇත.

**නිගමනය :-**

සේවා සේවක ගැටළු විසඳා ගැනීමට වෘත්තීය සමිති සහ පාලකයන් අතර සාකච්ඡා පැවැත්වීම ඉතා වැදගත් කාරණයක් වන අතර, එවැනි අවස්ථාවන්හිදී සියල්ලන්ට සම අවස්ථා ලබා දීම වඩාත් වැදගත් බව පෙන්වා දෙනු කැමැත්තෙමු. පැමිණිලිකරු වගඋත්තරකාර ආයතනයේ සේවකයෙකු වන අතර, වෘත්තීය සමිතියක ලේකම්ධූරය දරමින් ආයතනයේ පාලනාධිකාරිය සමඟ 2017.02.14 දින පැවැති සාකච්ඡාවකට සහභාගීවීමට කටයුතු කිරීමේදී වගඋත්තරකරුවන් අත්තනෝමතිකව කටයුතු කරමින් පැමිණිලිකරු එම සාකච්ඡාවට සහභාගී වීම වළක්වා ඇති බව පැමිණිල්ලේ සාක්ෂි අනුව සනාථ වේ. සේවක ගැටළු නිරාකරණය කරගැනීමේදී සේවා, සේවක සාකච්ඡා පැවැත්වීමට වෘත්තීය සමිති කටයුතු කිරීමේදී වෘත්තීය සමිති නියෝජිතයන් ලෙස ඔවුනට ව්‍යවස්ථානුකූලව හිමිව ඇති අවස්ථා අහිමි කිරීමක් මෙහිදී සිදුවී ඇති බව නිරීක්ෂණය වී ඇත. එමෙන්ම ඉතා වැදගත් මානව හිමිකම් සංකල්පයක් වන සමානාත්මතාවයේ අයිතාවාසිකමද අහිමි කිරීමක් මෙහිදී සිදුවී ඇත.

තවද 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (ඇ) ව්‍යවස්ථාව මඟින් වෘත්තීය සමිති පිහිටුවීමේ සහ වෘත්තීය සමිතිවලට බැදීමේ නිදහසට ඇති අයිතිය තහවුරු කර ඇත. මෙහිදී වෘත්තීය සමිති සාමාජිකයන්ගේ පොදු ගැටළු ඔවුන්ගේ නියෝජිතයින් මඟින් කළමණාකරණය සමඟ විසඳීම වැදගත් හා අන්තර්ගත අයිතියක් වේ. වෘත්තීය සමිති ශාඛා ලේකම් සමඟ සාකච්ඡාවට එළඹීම ප්‍රතික්ෂේප කිරීම පැමිණිලිකරුගේ මෙන්ම වෘත්තීය සමිති සාමාජිකයින්ගේද වෘත්තීය සමිති අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුවන බවද නිරීක්ෂණය වේ.

එමෙන්ම, පැමිණිලිකරුට සාකච්ඡාවට සහභාගී වීමට ඉඩ නොදීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වන ව්‍යවස්ථාවේ සීමාකිරීම් අභිබවා යමින් 14(1) (අ) ව්‍යවස්ථාවේ සඳහන් 'භාෂණයේ නිදහස සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළකිරීමේ නිදහස' අහිමි කිරීමක් වේ.

තවද, වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් දක්වා ඇති 'නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය' යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය කරමින් පැමිණිලිකරු වෙනස්කමකට භාජනය කර ඇති බව ඉහත නිරීක්ෂණය අනුව තහවුරු වී ඇත. ඒ අනුව වගඋත්තර පාර්ශවීය ක්‍රියාකලාපය තුළින් පැමිණිලිකරුගේ

ඉහත දක්වන ලද මූලික අයිතීන් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව පහත පරිදි නිර්දේශ කෙරේ.

01. පළවන හා දෙවන වගඋත්තරකරුවන් විසින් මින් ඉදිරියට පැමිණිලිකරු ආයතනය තුළ කිසිදු ආකාරයක වෙනස්කමකට භාජනය නොකළ යුතු අතර, අනෙකුත් වෘත්තීය සමිති නිලධාරින්ට හිමි අයිතිවාසිකම් පැමිණිලිකරුටද භුක්ති විඳීමට ඉඩ සලසා දිය යුතුය.

02. පළවන හා දෙවන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට රු. 5,000/- බැගින්.වූ වන්දි මුදලක්ද ගෙවීමට කටයුතු කළ යුතුය.

2022.02.03 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commission of Sri Lanka

මෘ.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

සැ.යු :- අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලි පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

B/